



යූ.ජී. සසන්දි නිහිංසා පොල්කොටුව

කෘතියේ නම		දිරිමත් යහළුවෝ

කතෘගේ නම		යූ.ජී . සසන්දි නිහිංසා පොල්කොටුව

කතෘ අයිතිය ඇතලු විස්තර

**ISBN No : 978- 624-208-433-6**

පිටකවර සිතුවම් සහ අනෙක් සිතුවම් නිර්මාණය

ආර්.එම්. දිනෙත් ජීවන්ත

7 ශ්‍රේණිය

වත්තේගම බාලක විද්‍යාලය

කතෘගේ වෙනත් කෘති

පුංචි කතාන්දර, නොසිතූ විපතක්

කෘතිය පළ කරන දිනය :- 2025/02/08

## පිදුම

**සුසිල දිය දහරක්ම**

**වේය හදවත ඔබේ....**

**පිවිතුරුය, සිසිලසයි**

**ගලන්නේ ඔය නෙතේ....**

**තවම ළා දලුපත්ය**

**සියුමැලියි ලොව මගේ....**

**කුසුම පල දරන්නට**

**සරසන්න පියාණනි....**

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# දිරිමත් යහළුවෝ



ඈත පිටිසර සුන්දර ගම්මානයක සදලි, තරුකි, පවනි, විහග, සුපුන්, බිනුක කියලා පුංචි යාලුවන් කිහිප දෙනෙක් සිටියා. මොවුන් ඉගෙන ගත්තේ එකම පාසලේ. වෙනදා වගේම සුපුරුදු පරිදි පුංචි යාලුවෝ පාසලට පිය මැන්නේ කිරි කොක්කු රෑනක් වගේ. නිල්ල ගැසුණු මනරම් කෙත්වතු යාය මැදින්, ගත සිත ප්‍රබෝධවත් කරමින් හමා එන නැවුම් මදනලේ සිසිල් සුවය විඳ ගනිමින්, වනරොද හරහා දිව යන අඩිපාර දෙපස ඇති එලින් බර ගස්වල ගඩා ගෙඩි පොකුරක මිහිරි රසය විඳින මේ යාලුවෝ පාසල් යන ගමනේ ආස්වාදය උපරිම ලෙස විඳ ගත්තා. ඒත් අද පාසල් යන ගමනේදී යාලුවන්ගේ හිත්වල

පුංචි බියක් ගැබ්වෙලා තිබුණා. ඒ මොකද දන්නවද? අද තමයි ඉස්කෝලේ ක්‍රීඩා උත්සවයේ ධාවන හා කණ්ඩායම් තරගවලට ක්‍රීඩක ක්‍රීඩිකාවෝ තෝරන දවස. ඉතින්, මේ යාලුවෝ හය දෙනාම තරගවලට ඉදිරිපත් වෙන්න බලාපොරොත්තුවෙන් හිටියා.

උදෑසන ආගමික වතාවත්වලින් අනතුරුව පන්තිවල ඉගැන්වීම ආරම්භ වුණා. සිංහල, ඉතිහාසය, භූගෝලය, ගණිතය, විද්‍යාව විෂයන්හි දැනුම් සයුරේ කිමිදෙමින් සිටි යාලුවන්ට පාසල නිමා වන සීනුව ඇහුනේ සිහිනෙන් වගේ. ගාථා කියලා ඉවරවෙලත් හැම දෙනාම ප්‍රර්ථනා කලේ කොහොම හරි තරගෙට තේරෙන්න කියලා කවදා හරි නගරේ ක්‍රීඩා පිටියේ අනිත් යාලුවොත් එක්ක තරග කරන්න හැමෝම ආසාවෙන් හිටියා. ඒ පුංචි බලාපොරොත්තුව හිත්වල දරාගෙන උද්‍යෝගිමත්ව යාලුවෝ පිට්ටනියට ගියා. ළමයි ගොඩක් ඒ ඒ තරගවලට සූදානමින් ඇග උණුසුම් කිරීමේ ව්‍යායාම වල යෙදෙමින් සිටියා. ඉතින්, මේ යාලුවොත් තම තමන්ගේ නිවාසවල පුහුණුවීම් තියෙන තැනට ඉක්මනින් ගියා. තරුකියි, බිනුකයි හිරු නිවාසයටත්, සදලියි, විහගයි, පවනියි, සඳු නිවාසයටත්, සුපුන් තුරුලි නිවාසයටත් වශයෙන් බෙදී ගියා.

පුහුණු වීම් වලින් පස්සේ යාලුවෝ හැමෝම ගෙදර ගියා. ඊට පස්සේ සුපුරුදු පරිදි පවනිලාගේ ගෙදර අඹ ගස යටට එකතු වුණා.

මුලින්ම යාලුවෝ අතර නිහඬතාව බින්දේ විහග. "අපි අඹ ගෙඩියක් කමුද? මට නම් බඩගිනියි" විහග කිවුවා. "ඔයාට නම් කොයි වේලාවෙත් එහෙම බඩගිනි එනවනේ" පවනි කිවුවා. ඒ කතාවට නම් යාලුවෝ හැමෝම හිනා වුණා. ඒත් බිනුක නම් හිනාවුණේ නෑ. එයා හිටියේ වෙනම කල්පනාවක "බිනුක?" සදලි බිනුකට කතා කළා. බිනුක ගැස්සිලා එයාගේ සිහින

ලෝකෙන් අවදි වුණා. " ඔයාට තියෙන ප්‍රශ්නේ මොකක්ද?" අඹ කඩන්න ගහට නගින ගමන් සුපුන් ඇහුවා. බිනුක ලොකු හුස්මක් අරගෙනම කතාව පටන් ගත්තා. "ප්‍රශ්නේ මේකයි. මම තරගවලට තේරුණේ නෑ. මම හිතාගෙනමයි හිටියේ මම තේරෙයි කියලා. වැඩක් නෑ. අනිත් ළමයි මට වඩා දක්ෂයි. අපරාදේ මම තරගෙට ඉදිරිපත් වුණේ". "ආ ආ එහෙම හිතන්න එපා. ජයග්‍රහණයට වඩා සහභාගීත්වය වැදගත් කියලා කියමනකුත් තියෙනවනේ." පවනි එහෙම කියද්දී අනිත් යාලුවොත් බිනුක ළගට ආවා. "අපි හැමෝටම දුර්වලතා වගේම දක්ෂතා තියෙනවා. අපි ඒවා අඳුන ගෙන වැඩ කරන්න ඕනෑ". පුංචි යාලුවෝ හැමෝම විහගගේ අදහස අනුමත කලා. "ඒ වගේම දුර්වලතා ගැන දුක්වෙන්න හොද නෑ". සදලිගේ කතාව හැමෝම හිතට ගත්තා. " අපේ අඩුපාඩු, දුර්වලතා හදාගෙන, වැඩිහිටියන්ගේ උපදෙස්වලට අනුව ඒවා නිවැරදි කරගෙන ඉදිරියට යන්නත් ඕනෑ" සදලිගේ වටිනා අදහසට තරුකි තවත් කොටසක් එකතු කළා. "ඔව්, දැන් බිනුකට දුවන තරග ඇරුනම සහභාගී වෙන්න පුලුවන් කොච්චර තරග තියෙනවද? එයා විසි කිරීම් ඉසව් වලට ගොඩක් දක්ෂයිනේ. ඔයාට පුලුවන් යගුලිය හරි හෙල්ල හරි විසිකරන තරගයකට සහභාගී වෙන්න". විහග බිනුකගේ පිටට තට්ටු කරලා කිව්වා. " ආ... මෙන්න අඹ" සුපුන් හැමෝටම අඹ දුන්නා. " අනේ... ඔය අඹ කඩලා හෝදලා කපාගෙනත් ඇවිල්ලා" සදලි කිව්වා. "ඒක තමයි මාත් බැලුවේ මේ සුපුන් අපිට නොකියාම ගෙදර ගිහිල්ලද කියලා" විහග පුදුමයෙන් කිවුවා. "මම ඔයාලගේ සාකච්ඡාවට බාධා කරන්නැතුව ගියා ඉතින්" සුපුන් අඹ කැබැල්ලක් රස බලමින් කිවුවා. "සුපුන් හරි ගානටම තමයි අඹ කඩලා තියෙන්නේ" විහගගේ ඒ ප්‍රකාශයට සුපුන් පිළිතුරු දුන්නේ මෙන්න මෙහෙමයි.

"මේ ගසේ බොහෝ පැණි දොඩම් ඇතී

වැඩිය කඩන නරක ළමයි හෙම නෙවෙයි අපී"

"ඒ නිසා මම ගානටම ගෙඩි කැඩුවා" සුපුන් කිවුවා. "හරි ඉතින් මේක පැණි දොඩම් ගහක් නෙවෙයිනේ" විහග තම තර්කය ඉදිරිපත් කළා. "ඒත් ඒ කවිය හැම ගහකටම පොදුයි" බිනුක කිව්වා. "ලද දෙයින් සතුටු වෙන්න විහග, ලද දෙයින් සතුටු වෙන්න" පවනි කිව්වා. හරි, හරි අද ඉදන් මම ඒක හිතට ගන්නම්කෝ" විහග කිවුවා. "හොදටම හවස් වෙලා නේද? දැන් අපි ගෙදර යමු" තරුකි තම හඬ අවදි කළා. මේ විදිහට තමයි යාලුවන්ගේ එදා හවස් වරුව ගත වුණේ. "එහෙනම් අපි යනවා පවනි. සුබ සැන්දෑවක්!" යාලුවෝ කිවුවා. ඔවුන් සතුටින් සමු අරගෙන තම තමන්ගේ ගෙවල් බලා පිටත් වුණා. වත්තේ දෙවැට ළගට දුවගෙන ගිය පවනි, පන්සල පාරේ වංගුවෙන් හැරිලා යාලුවෝ නොපෙනී යනකන්ම අත වැනුවා. තමන් අද කණ්ඩායම් තරගේ දක්වපු දක්ෂතා ගැන නිවාසය භාර ගුරුතුමිය වූ සමන්මලී මැඩම් කරපු ප්‍රශංසාත්මක වර්ණනාව පවනිට තාමත් ඇහෙනවා ඇහෙනවා වගේ. ක්‍රීඩා උත්සවය දවසේ මීටත් වඩා හොදින් තරග කරලා කොහොමහරි මුලු කණ්ඩායමත් එක්කම ජයග්‍රහණයේ සතුට බෙදා හදා ගන්න පවනි අධිෂ්ඨාන කරගත්තා. සමන්මලී මැඩම් තමන්ගේ ක්‍රීඩා කුසලතාව අගය කරපු හැටි මතක් වෙන කොට, ඒ වේලාවේ අනිත් ළමයි තමා දිහා බලන් හිටපු විදිය මතක් වෙන කොට පවනිට දැනුණු සතුට මහමෙරක් තරම්. පවනි ඉගෙනීමට වගේම ක්‍රීඩාවටත් දක්ෂයි කියලා පෙන්වන්න එයාට ලොකු වුවමනාවක් තිබුණා. "දැන් ඉතින් ඒකත් හරි" පවනි තමන්ටම කියා ගෙන සැනසුම් සුසුමක් හෙලුවා. "ලොකු දුව, පවනි... කෝ මේ ළමයා? ආ... මේ ඉන්නේ. අනේ දරුවෝ අත් දෙක

සෝදගෙන මේ වට්ටියට මල් දෙක තුනක් කඩාගෙන එන්නකෝ" ආච්චි අම්මා කතා කළා. එතකොට තමයි පවනි පියවි සිහියට ආවේ. වෙලාව හවස පහයි හතලිස් පහයි!

යාලුවොත් එක්ක කතා කරලා, සෙල්ලම් කරාට පස්සේ බිනුකගේ දුක හුගාක් අඩු වුණා. "විහග කිවුවේ ඇත්ත තමයි. මට පුලුවන්නේ විසිකිරීම් ඉසව්වකට ඉදිරිපත් වෙන්න" බිනුකට හිතුණා. " හෙට යගුළිය විසි කිරීමටයි, හෙල්ල විසිකිරීමට ඉදිරිපත් වෙලා බලන්න ඕනෑ" ඔහු තීරණය කළා. ඔන්න එතකොට එකපාරටම ළමයි කණ්ඩායමක් හූ හඬින් නගමින් බිනුක ඉස්සරහට කඩා පැන්නා. " මෙන්න මේ බයගුල්ලා ඇවිල්ලා. හරියට දුවා ගන්නවත් පණ නෑ හූ... හූ..." මේ විදියට ගොඩක් ඇනුම් පද කියමින් මෙයාලා බිනුකට සමච්චල් කළා. මේ ඉන්නේ තමන්ගේම පන්තියේ පිරිසක් බව බිනුක හඳුනාගත්තා. බිනුක නම් මේ ඇනුම් බැනුම් පොඩ්ඩක්වත් ගණන් ගත්තේ නෑ. දැන් එයා හරිම සංවේදී, බියගුලු කෙනෙක් නෙවෙයි. එයා දැන් වෙනස් කෙනෙක්. එයා තමන්ගේ හඬ අවදි කළා.

"මම තරගෙට ඉදිරිපත් වුණ එක ගැනවත්, පැරදුණ එක ගැනවත් මට කිසිම දුකක්, පසුතැවීමක් නෑ. මොකද, අද මම ගොඩක් දේවල් ඉගෙන ගත්තා. මාව වට්ටන්න හදන අයට මම උත්තර දෙන්නේ ක්‍රියාවෙන්. මම යගුලිය විසි කරලා දිනන හැටි බලන්නකෝ" මේ කතාවට නම් හැමෝම නිහඬ වුණා. "හ්ම්... අපි බලමුකෝ. ඔයා මේ අභියෝග කරන්නේ මලල ක්‍රීඩා ශූරයෙකුට කියන එක ඔයා හොඳට මතක තියා ගන්න." මෙතුන් ඇතුලු ළමයි කිවුවා. "අභියෝගය භාර ගන්නවා" බිනුක එඩිතර හඬින් කිවුවා. ඊට පස්සේ හැමෝම විසිරිලා ගියා. මෙතුන් ප්‍රධාන පාර දෙසටත්, ඔහුගේ සගයෝ වෙල් යාය

දෙසටත් ගිය අතර බිනුක සුපුරුදු පරිදිම කැලෑ පාර දිගේ ගියා. වෙල් යාය මැදින් යන මෙතුන්ගේ යාලුවෝ කතාවට වැටුණා. "මේ.... අර අභියෝගයෙන් මෙතුන් දිනයිද?" සදරු අනිත් අයට ප්‍රශ්නයක් යොමු කළා. "අනිවාර්යෙන්ම දිනන්නේ ඉතින් අපේ ලොක්කා තමයි" නුවන් හරිම සැහැල්ලුවෙන් පිළිතුරු දුන්නා. "ඔය බිනුකයට පුලුවන්ද අපිත් එක්ක හැප්පෙන්න?" නුවන් වෙලට නැමී වී කරලක් කඩා ගන්න ගමන් කිවුවා. "අනිත් එක, ඔයාලා මොකටද බය වෙන්නේ? මෙතුන් ඒක බලා ගනියි. අපිට තියෙන්නේ බලාගෙන ඉන්න තමයි" නුවන් ඒක කිවුවේ වී කරලෙන් කඩාගත් වී ඇටයක් සපන අතරතුරයි. ඒ කතාවෙන් පස්සේ යාලුවන්ගේ හිතේ තිබුණු බියමුසු බව පහව ගිහින්, මුහුණුවල සිනා රැල්ලක් ඇඳුණා. "ඔව් ඔව් ඒක තමයි. ප්‍රශ්නේ එන විදිහකට එයා මුහුණ දෙයි." යාලුවෝ හැමෝම එක හඬින් කිවුවා.

ඔන්න ඔය අතරේ හිටියා වෙන යාලුවෙක්, චුට්ටක් බය වෙලා තාමත්. ඒ තමයි බිනුක. "මම මොකටද ඔය මෙතුන්ලට බය වෙන්නේ? එයාලගේ කට විතරයි, වැඩ නෑ. මම හොදට මහන්සි වෙලා වැඩ කරලා මේ අභියෝගය ජය ගන්නවාමයි, ඒක අත් අරින්නේ නෑ. මම බයත් නෑ. මට ඒක කරන්න පුලුවන්" බිනුක ස්ථිර අධිෂ්ඨානයක් ඇති කරගන්නා. වෙලාවකට එයාටම පුදුම හිතෙනවා එයා කොහොමද මෙච්චර ධනාත්මකව හිතන්නේ කියලා. "ඒකට හේතුව ආත්මාභිමානය. තමන් කෙරෙහි තමන්ම ඇති කර ගන්නා අභිමානය, ආඩම්බරය" එයාම ඒකට පිළිතුරුත් දෙනවා. එකම එක පුංචි උපදේශයකින් ළමයෙකුව මෙච්චර වෙනස් කරන්න පුලුවන්ද?

පසු දිනත් සුපුරුදු පරිදිම පාසල පැවැත්වුණා. ඒ වගේම නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ තරග පුහුණුවීම් ද පැවැත්වුණා. එදා උදෑසන සිටම බිනුක

හිටියේ ප්‍රබෝධමත්වයි. පාසල් යන්න ගෙදරින් පිටත් වෙනකොට බිනුක අම්මාට මතක් කළා අද තරගවලට තෝරා ගැනීමට ඉදිරිපත් වෙලා පුහුණුවීම් ඉවර වෙන කොට ගෙදර එන්න හවස හතර හමාර විතර වෙයි කියලා කීවා නැත්තම් අම්මා කලබල වෙනවා. අම්මා බිනුකට ගොඩක් ආදරෙයි කියලා එයා හොදටම දන්නවා. " මම අම්මාට ආඩම්බරයක් ගෙනත් දෙන්න උත්සහ කරනවා" බිනුක හිතුවා. ඉතින් ඒ උදාර පරමාර්ථය හිතේ දරාගෙනම බිනුක පාසල් යන්න පිටත් වුණා.

බිනුක එදා හොදින් පාඩම් වැඩවල නිරත වුණා. ඔහු ප්‍රශ්නවලට හොදින් පිළිතුරු දුන්නා. එදා දවසේ උගන්වපු හැම විෂයකම ප්‍රගතියක් පෙන්නුම් කරන්න ඔහුට හැකියාව ලැබුණා. "මොකක්ද මේ අරුමේ?" ගුරුවරුන්ට වගේම බිනුකගේ යාලුවන්ටත් ඔහුගේ මේ වෙනස හිතා ගන්න බැරි වුණා. "බිනුක දැන් අධ්‍යාපනයට උනන්දු වී ගෙන එනවා වගේ" ගුරුවරුන් සතුටින් කිවුවා. ඒ මොකද දන්නවද? බිනුක කියන්නේ වැඩට කම්මැළි, සෙල්ලමටම බර ළමයෙක් නිසා. "බිනුකගේ චරිත ස්වභාව වෙනස් වීම නම් හොදයි හැබැයි ඒක හැමදාටම තිබුණනම් ඊටත් වඩා හොදයි" විහගගේ කතාව අනිත් හැමෝම අනුමත කළා.

ඔන්න ඉතින් බිනුක බලාගෙන හිටපු වේලාව ආවා එයා බොහොම උද්‍යෝගයෙන් තරගයට සහභාගී වුණා. හිතුවා වගේම එයා යගුලිය විසි කිරීමෙන් මනා දක්ෂතාවක් විදහා පෑවා. හෙල්ල විසි කිරීමේදීත් ඒ ජවය හා දක්ෂතාව ඔහු පෙර සේම පවත්වා ගත්තා. මිටිය විසි කිරීමේ දීත් හිරු නිවාසය නියෝජනය කිරීමේ භාග්‍යය ඔහුට උදා වුණා කියලා නිම කරන්න බැරි සතුටක් බිනුකට ඇති වුණා. හොදින් පුහුණුවීම් කරන්න ඔහු අධිෂ්ඨාන කර ගත්තා.

අධිෂ්ඨාන කළා වගේම නොකඩවා පුහුණුවීම් පැමිණීමටත්, උනන්දුවෙන් පෙරහුරු අභ්‍යාසවල යෙදෙන්නත් බිනුක කටයුතු කළා.



දින, සති, මාස ගෙවුණා නෙවෙයි ඉගිලුණා, හරිම වේගයෙන් කාගෙත් සිත් සතන්වල තුටු හැඟුමන් ජනිත කරවමින්, බලාපොරොත්තු සහගත දෙනෙත් දීප්තිමත්ව දිදුලවමින් පැතිරගියේ වාර්ෂික නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙලේ මිහිරියාවයි. නගරයේ ක්‍රීඩා පිටිය වඩා ඇද තිබු අලංකාර කොඩිවැල් සුළඟට ලෙළ දෙන්නේ අමුත්තන් පිළිගන්නට වගේ. මදක් නොඉවසිල්ලෙන් වගේම සියුම් බියකුත් බිනුකට දැනුණා. ඒත් ඒ බිය කෙමෙන් පහව ගියේ සියලුම තරඟකරුවන් සඳහා පාසලේ ක්‍රීඩා උපදේශකතුමා දුන්න උපදේශය

මතක් වීමෙනුයි. ක්‍රීඩා උත්සවයේ මුල් තරග එකින් එක ආරම්භ වීමත් එක්කම සියලු දෙනාගේ හදගැස්ම ද වේගවත් වුණා. ඔන්න දැන් තමා බිනුකගේ වාරය. හොදින් පුහුණුවීම් කරලා තිබුණ නිසා බිනුකට තමා මේ කරන්න යන වැඩේ ගැන දැඩි විශ්වාසයක් තිබුණා. බිනුක තමන්ගේ ශිල්පීය ප්‍රාගුණ්‍යය ප්‍රේක්ෂකයන්ට දක්වමින් යගුලිය විසිකළා. ඒ වගේම හෙල්ල හා මිටිය විසි කිරීමේදීත් ඔහු අතිසාර්ථක වුණා. ඔහු එම තරග වට තුනෙන්ම රන් පදක්කම් දිනා ගත්තා. ඔහුට එදා දැනුණු සතුටු කියලා නිම කරන්න බැහැ. ඔහු තම අසුනේ වාඩි වුණේ ඉතිරි තරග නරඹන්න. ඔක්කොම තරග නිම වෙලා ආවේ හැමෝම බලාගෙන හිටපු අවස්ථාව. ඒ තමයි එක් එක් වයස් මට්ටමෙන් දක්ෂතම ක්‍රීඩකයා තෝරන අවස්ථාව. ඒ විසල් කුසලානයේ හිමිකරු තමන් කියලා මෙතුන් ලොකු බලාපොරොත්තුවක් තියාගෙන හිටියා. "වයස අවුරුදු 14න් පහළ දක්ෂම ක්‍රීඩකයා බිනුක බණ්ඩාර" කාටවත්ම අදහාගන්න බැරිවුණා. බිනුක බොහෝම සතුටින් වේදිකාවට ගියා. "බිනුක බණ්ඩාර ක්‍රීඩකයා හෙල්ල විසි කිරීමේ ඉසව්වෙන් නව පාසල් වාර්තාවක් බිහි කර තිබෙනවා" නිවේදකයා කියා සිටියා. බිනුක තමන්ගේ කුසලානය සහ සහතික පත්‍රය ලබාගත්තේ සියලු දෙනාගේ ඔල්වරසන් හඬ මධ්‍යයේයි.

එදා බිනුකගේ ජීවිතයේ රන් අකුරින් ලියවෙන දවසක්. එයාගේ ජීවිතයේ ලොකුම ජයග්‍රහණය ලැබුණු දවස තමයි එදා. අභියෝග කිරීම ගැන මෙතුන් බිනුකගෙන් සමාව ගත්තා. මෙතුන් දැන් බිනුකගේ යාලුවෙක්. අලුතින් කොච්චර යාලුවෝ හමු වුණත් විහගලා, පවනිලා තරම් හොද යාලුවෝ කොහේවත් නෑ කියලා බිනුකට හිතුණා. තමන්ගේ උත්සාහවන්තකම ගැන

බිනුකට හරිම සතුටුයි. ඒත් ඒ හැම දෙයක්ම පිටිපස්සේ ඉන්නේ තමන්ගේ කල්‍යාණ මිතුරෝ කියන එක බිනුක කවදාවත්ම අමතක කළේ නෑ.

නිමි.

පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබු භාග්‍යයකි. එම බීජ දලුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වු කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදාකාවක් ගොඩනගා දී තිබේ තම නියග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්.